# Path to Dharma

தர்ம நெறி ஓம் ධර්ම මාර්ගය

**News Letter** **7** **செய்தி மடல்**



க்ஷேத்திர(வயல்)விநாயகர் ஆலயம்,
ஸ்ரீ முன்னேஸ்வரம், சிலாபம், இலங்கை.


Kshethra Vinayaka Temple,Sri Munneswaram,Chilaw,Sri Lanka.

ශ්‍රී ගණ දෙවි දේවාලය (වෙලේ ), මුන්නේස්සරම, හලාවත, ශ්‍රීලංකා.

hot mail; kshethravinayaka@yahoo.com: munneswaram@yahoo.com




**Sri Sankar Publications**

**July** **2008** **ජූලි**

# Path to Dharma

தர்ம நெறி ॐ ධර්ම මාගීය



## News Letter 7 செய்தி மடல்



**க்ஷேத்திர(வயல்)விநாயகர் ஆலயம்,**
**ஸ்ரீ முன்னேஸ்வரம், சிலாபம், இலங்கை.**


Kshethra Vinayaka Temple,Sri Munneswaram,Chilaw,Sri Lanka.
ශ්‍රී ගණ දෙවි දේවාලය (වෙලේ), මුන්නේස්සරම, හලාවත, ශ්‍රී ලංකා.
hot mail; kshethravinayaka@yahoo.com; munneswaram@yahoo.com



Sri Sankar Publications
July 2008 யூலை

# News Letter - 7 - செய்தி மடல்

**Kshethra Vinayaka Temple,Sri Munneswaram,Chilaw,Sri Lanka.**

க்ஷேத்திர(வயல்)விநாயகர் ஆலயம், ஸ்ரீ முன்னேஸ்வரம், சிலாபம், இலங்கை.

**ශ්‍රී ගණ දෙවි දේවාලය (වෙලේ), මුන්නේස්සරම, හලාවත, ශ්‍රීලංකා.**



hot mail; kshethravinayaka@yahoo.com: munneswaram@yahoo.com

**Edited by: B.S.Sarma , Kshethra Vinayaka Temple,144, Sri Munneswaram,Chilaw,Sri Lanka.**


## ගණේෂ (විනායක)

හින්දු ධර්මයේ විනායක (ගණේෂ) කවුරුත් දන්නා දෙවි කෙනෙක් වන අතර වැඳුම් පිදුම් ලබන ප්‍රධාන දෙවියන් වෙනුවෙන් පෙනී සිටී. "ග" යනු සංස්කෘත භාෂාවෙන් බුද්ධියයි. (බුද්ධි) සහ "නා" යනු ඥාණයයි. (විඥාන) ඒ අනුව ගණේෂ දෙවියන් සලකනු ලබන්නේ බුද්ධියට සහ ඥාණයට අධිපති දෙවියන් ලෙසය. ඔහු පෙනී සිටින්නේ මිනිස් සිරුරකින් සහ හිස අලියෙකුගේ හිසින්ය. ගණේෂ දෙවියන් පෙනී සිටින්නේ තර්කානුකූල ප්‍රශ්න සඳහා වන අතර එමගින් බාධක විනාශ කෙරේ.

**ප්‍රතිමා විද්‍යාව**

ගණේෂ දෙවියන්ගේ සිරුර පිළිබඳ නොයෙක් අදහස් ඇතග වෙනස් වෙනස් ආකාරයට විස්තර කෙරෙන එමගින් සත්‍යතාවය දක්වන සහ එය ලබාගැනීමේ ආකාරය දක්වයි. ගනපති උපනිෂද් හි අතර්වයේ ගණේෂ දෙවියන් පිළිබඳව විස්තර වේ.

ගණේෂ දෙවියන්ගේ සිරුර පෙනී සිටින්නේ ආදිකල්පිත පළමු ශබ්දය වන ඕම් වලටය. ශක්තිය සහ ධාතු එක්වූ විට ශබ්දය සහ එළිය ඇති කෙරේ. එවිට ගණේෂ දෙවියන්ගේ මැවීමක් සේ සැලසේ. ඔහු පෙනී සිටින්නේ බලය සහ නිසලතාවය අතර සමතාව උදෙසාය. එසේම දියුණු කළ හැකි ගති ලක්ෂණ ශක්තිය පිළිබඳවය. ඔහු පෙනී සිටින්නේ වෙන්කර පෙන්විය හැකි හැකියාවට සහ සත්‍යය හා මායාව අතර වෙනස දැනගැනීමටය. බොහෝ සේ පොදුවේ ගයනු ලබන යාඥාව වේදයේ දක්වා ඇත. එය ගනපති ප්‍රාර්ථනාවේ පටන් ගැන්මය.

**"ඕම් ගනානා ආමිත්වා ගණපතිගුම් හවා මගේ කවිම් කවීනා මුපරශරා**
**විස්තමාම් ජේස්තරාජම් බ්‍රහ්මනාම් බ්‍රහ්මනාස්පත ආනා ෂරුන්වන් බුතිභි සිද් අසාධානම්"**

*(රිග් වේද 2.23.1)*

ගණේෂ දෙවියන්ගේ රූපය පැටලිලි සහිතය. එසේ එහි පැටලිලි සහිත වීමේ වටිනාකමක් ඇත. බොහෝ විට ගණේෂ දෙවියන්ගේ රූපය අත්හතරකින් යුක්තය. ලොකු ආමාශයකි. මියකු පිට පැමිණේ. සාමාන්‍යයෙන් ඔහු දැක්වෙන්නේ ඉඳගෙන සිටින අයුරිනි. එක් පාදයක් ඔසවා අනෙක මතට නැමී ඇත. ඉන් දැක්වෙන්නේ දිව්‍යත්වයයි. සමහර රූපවල අත් 6 ක්, 8 ක්, 10 ක්, 12 ක් හෝ 14 ක් ඇත.

සෑම අතකම එකකට එකක් වෙනස් ලකුණක් ඇත. සම්පූර්ණයෙන් ලකුණු 57 ක් ඇත. කලාතුරකින් අත් දෙකකින් යුත් ගණේෂ පිලිමද දක්නට ලැබේ.

හින්දු දෙවිවරුන්ට අත් වැඩි ප්‍රමාණයක් දක්වන්නේ ඒ දෙවිවරුන් බැව් දැකවීමටය. ඔවුන් මිනිසුන්ට වඩා වෙනස්ව දැක්විමටය. එසේම ඔවුන්ට මිනිසාට වඩා බලයක් ඇති බව දැනගත් විටය. හින්දු පිලිම පිළිබඳව ටී. ඒ. ගෝපිනාත් රාම්ගේ හින්දු පිලිම දිව්‍ය යන පොතේ මෙසේ සඳහන් කර ඇත. හින්දු පූජාකරුවන්ට පිලිම මෙන් භූගෝල සාසත්‍රඥයින්ට රූප සටහන් වැනිය.

**භාග්‍යයේ දෙවියෝ**

ගනේෂ දෙවියන් භාග්‍යයේ දෙවිඳුන්ය. එසේම බාධක විනාශ කරන්නාය. එබැවින් සියළුම කාර්‍යයන් ඇරඹීමට පෙර ඔහුගේ ආශිර්වාදය අපේක්ෂා කෙරේ. එමගින් බාධක දුරුකර භාග්‍යය අපේක්ෂෙ කෙරේ.

**ගනේෂ දෙවියන්ගේ ශාරීරික ලක්ෂණ - හින්දු දර්ශනය**

හින්දු භක්තිකයින් වැදුම් පිදුම් කරන්නේ නමක් නැති හැඩරුවක් නොමැති ඉතාම උසස් සත්‍යටය. එම සත්‍යම තුළ නොයෙක් රූප සහ නම් ඇත. මෙම එකම සත්‍යය ප්‍රකාශ කෙරෙන්නේ වෙනස් ආකාර දෙවිවරුන් සහ දේවතාවියන් මගිනි.

ප්‍රතිමාව යනු එක්තරා යන්ත්‍රයකි. එමගින් දෙවියන් වෙතට ඇස් සහ සිත යොමු කරවනු ලබයිග හින්දු භක්තිකයින් පිලිම වලට වැඳීම යනු පිලිම වන්දනාව නොවේ. එහෙත් ඒවා දෙවියන්ගේ අනුරුය. විෂ්ණු සම්හිතාවේ. (පරි. 29 කොටස් 55-7)

"සිරුරක් නොමැතිව දෙවියන් ඇසුරෙන් භාවනා කරන්නේ කෙසේද? ඔහුට සිරුරක් නොමැති නම් සිත යොදවන්නේ කුමකටද? සිත යමක් කෙරේ ඇදී යාමට කුමක් හෝ නොමැති නම් සිත භාවනාවෙන් ගිලිහී යයි. නොඑසේ නම් නිදිමතවේ. එම නිසා ඥාණවන්තයින් යම් පිලිරුවක් මතකයට නගමින් එය සත්‍යයෙන් තොර බැව් දැන භාවනාවේ යෙදේ"

ආගමිකව ලකුණු ඉතා වටිනා ක්‍රියාකාරිත්වයක් ඉටු කරයි. හින්දු ධර්මය ලෝකයේ පැරණිම ශිෂ්ටාචාරයක් සේ දිගටම පැවතේ. ඉතිහාසගත වන්නට පෙර සිට හින්දු චාරිත්‍ර පැවති ඇත. අහම් බ්‍රහමම් අස්මි (මම බ්‍රහ්ම වෙමි) සැම දෙයකම ජීවයයි. අහම් සහ (මමයි බ්‍රහ්ම) සිරුරකින් ආවරණය කල ආත්මය. මෙම තතත්වයන් තේරුම් ගැනීමට නොදියුණු සිතකට නොහැකිය. වේදයන්හි ඇති මෙම උසස් සංකල්පයන් ලකුණක ඇතුල් කළ යුතුය. සත්‍යය සැගවීමෙන් කෙලෙසීමෙන් ආරක්ෂා කෙරේ. ඉන් අදහස් වූයේ ගැඹුරින් සත්‍යය සොයන්නටය. සත්‍යයේ අවස්ථා ඇත. සර්වබලධාරී දෙවියන් වහන්සේට රූපයක් නොමැත. එහෙත් හැකි සැම රූපයක්ම සතුය. හින්දු දෙවිවරු නොයෙක් අයුරින් වටහා ගනු ලබන සහ සත්‍යය කරා ලගාවන්නෙක් වෙති.

ගනේෂ දෙවියන්ගේ ශරීරයේ සැම කොටසකම වැදගත්කමක් ඇත. ගනේෂ දෙවියන්ගේ සිරුරින් දැක්වෙන්නේ පැරණි හින්දු මුනිවරයින් වටහා ගන්නා ලද පරිදි නිසි තත්ත්වයයිග එහි ගැඹුරු ආධ්‍යාත්මික බලයක් හා වටිනාකමක් ඇත.

දෙවියන්ගේ සිරුර ඕම් යනුය. ඔහු ඕම්කාර යනුවෙන් හැඳින්වේ. එනම් ඕම් ගනේෂයන්ගේ සිරුරයි. ඔහු මුළු විශ්වයටම පෙනී සිටී. ආශ්චර්යමත් ලොවේ පත්ලේ ඔහු ඇත. (විශ්වධර - ජගදෝධර)

ඔහුගේ විශාල ආමාශයෙන් දැක්වෙන්නේ විශ්වානියත්වය, ඥාණය තේරුම් ගැනීමේ ශක්තිය සහ අසාමාන්‍ය දැනුමයි. කෙනෙකුට ජීවිතයේ සම්පූර්ණත්වයට පත්වීමට මේ ගුණයන් අවශ්‍යවේ. ගනේෂ දෙවියන්ගේ විශාල මුඛයෙන් දැක්වෙන්නේ ලොව තුළ ඇති මිනිසාට විඳිය හැකි සැප සම්පත් වේ. විශාල කන් වලින් ඥාණ ශක්තිය ඇහුන්කන් දීමේ හැකියාව සහ ආධ්‍යාත්මික සත්‍යය හඳුනා ගත හැකිය. එමගින් ඇහුන්කන් දීමේ වටිනාකම පෙන්වා දේ. දැනුම ලබාගැනීමට දැනගතු යුතු විය සියලු දේ ගැන දැනුම ඇතිවේ. එසේම විශාල කන් වලින් දැක්වෙන්නේ පූර්ණ පුද්ගලයෙකු යනු සියල්ලටම කන්දිය හැකි අයෙකු යන්නය.

කවාකාර හොඬයෙන් දක්වන්නේ සත්‍යය සහ අසත්‍යය වෙන්කර ගැනීමේ හැකියා ඥාණයයි. ගනේෂ දෙවියන්ගේ හොඩින් ගස් ඉදිරීමටත් බිම ඇති ඉදිකටුවක් ගැනීමටත් හැකියාව ඇත. එසේම මිනිසාටද ජීවිතයේ ජයග්‍රහණයන්ට සහ පසු බැම්වලට ඔරොත්තු දීමේ හැකියාව තිබිය යුතුය. එසේම ලෞකික ජීවිතයේ ඇතුල් පැත්ත වටහා ගත යුතුය. මුව දෙපස ඇති දලදෙකින් දැක්වෙන්නේ මිනිසා සතු දෙයාකාර වූ ඥාණය සහ හැගීමය. නොකැඩුන දළ වලින් දැක්වෙන්නේ මායාවන්ගෙන් මිදීමය. එසේ කෙනෙකු තම ඥාණය මෙහෙවයා හැගීම් විනාශ කළ යුතුය. ඒ අනුව ශ්‍රේෂ්ඨත්වයට පත්විය යුතුය.

සාමාන්‍යයෙන් අලියෙකුට ඇත් දළ දෙකක් ඇත. සිත තුලද නිතරම විකල්ප දෙකක් ඇත. එනම් හොඳ සහ නරකයි. විශිෂ්ඨ සහ හදිසිය සත්‍යය සහ බොරුව මගින් නොමග යවා අවදානම ඇති කරයි. යම් කාර්‍යයක් කිරීමේදී සිත තුළ අධිෂ්ඨානය ඇති කර ගත යුතුය. අලියෙකුගේ ඇස්වල මායාවද ඇත. එමගින් යම් දෙයක් ඇති තරමට වඩා ලොකුවට දක්වයි. ඒ අනුව අලියාගේ අස්වලින් දැක්වෙන්නේ යම් පුද්ගලයෙකු ඥාණයෙන් වැඩිවත්ම තමාට වඩා ලොකු බවය. එනම් උඩගුකමින් බැහැරව නිහතමානි විය යුතුය. ගනේෂ දෙවියන්ගේ සිරුරේ වම්පසින් දැක්වෙන්නේ හැගීම්ය. දකුණුපසිල් දැක්වෙන්නේ දැනුම සහ යුක්තියයි.

ඔහුගේ කකුල් වල පිහිටීම දකුණු කකුල වම් කකුල මතින් එල්ලෙයි. එක කකුලක් බිම තබා ඇති අතර අනෙක ඔසවාගෙන ඇත. ඉන් දැක්වෙන්නේ ජීවත්වීමේ වටිනාකම සහ දිව්‍යමය ලොව තුළ සහභාගිත්වය සහ ආධ්‍යාත්මික ලොවේ සහභාගිත්වයයි. ලෝකය තුළ සාර්ථක දිවියක් ගෙවීමයි. එසේ දිවි

ගෙවන්නේ ඥාණය සහ යුක්තිය ආධාරයෙන් හැගීම් යටපත් කරමිනි. ගනේෂ දෙවියන්ගේ අත් සතරින් දක්වන්නේ ඇතුළත ඥාණාංග සතරයි. එනම් සිත (මනස්) දැනුම (බුද්ධි) අහංකාරය (අහම්කාර) සහ දැනිම (චිත්ත) යි. ගනේෂ දෙවියන්ගෙන් පිළිඹිබු වන්නේ පිරිසිදු දැනුම (ආත්මයයි) එමගින් එම සවැදෑරුම් ගුණාංග ක්‍රියාත්මක වේ.

ඉහල අතෙහි ඇති පොරොවෙන් සියළු ප්‍රහින කිරීමත් සියලු දුක් වේදනා දරාගන්නා යනුත් දක්වයි. මෙම පොරොවෙන් ගනේෂ දෙවියන් සියළු බාධා දුරලිය හැකිය. එම පොරෙරාවෙන් මිනිසා නිසි මගටත් සත්‍යයේ මාවතටත් යොමුකල හැකිය. දකුණු පස ඉහල අතෙහි නෙලුම් මලකි. ඉන් දැක්වෙන්නේ මිනිස් ව්‍යාප්තියේ ඉහලම තත්ත්වයයි. ආධ්‍යාත්මික පාරිශුද්ධත්වයට පත්වීමට සියළු

ලෞකික බැඳීම් වලින් මිදිය යුතුය. එසේම හැගීම් පාලනය කළ යුතුය. මේ අනුව කෙනෙකුට කිසිදු බලපෑමකින් තොරව ලොකයේ අවහිරයක් නොවන්නාසේය.

වම්පස පහල අතින් කසයක් දරා ඇත. භක්තිවන්තයා දෙවියන් කෙරේ ඇද බැඳ තබයි. කසයෙන් දක්වන්නේ ලෞකික බැඳීම් සියල්ලෙන් වෙන් විය යුතු බවය.

දකුණුපස පහත අතින් (සැදෑහැවතා වෙත දික්කර ඇති) දක්වන්නේ ආශිර්වාද කරන ආකාරයයි. ඉන් දක්වන්නේ ගනේෂ දෙවියන් නිතරම සැදෑහැවතුන්ට ආශිර්වාද කරන බවය. එය ආශිර්වාදයේ ආරක්ෂාවේ ඉරියව්වකි. (අභය) ගනේෂ දෙවියන්ගේ කලයක් වැනි බඩෙහි තොරක් නොමැතිව විශ්වය ඇත. ඉන් දැක්වෙන්නේ ස්වභාව ධර්මයේ විශාලත්වය සහ දුක්වේදනා ගිල දැමීමේ හැකියාවයි.

සියළුම හොඳ සහ නරක දෙයකට මුහුණ දීමට ඇති හැකියාව පෙන්වයි. එසේම විශ්වය පාලනය කිරීමේ හැකියාව පෙන්වයි. මිනිස් සිරුරට ඇත්තේ මිනිස් හදවතකි. එයින් සැමට කරුණාව, මෛත්‍රිය දක්වයි. ගනේෂ දෙවියන්ගේ සිරුර වැඩි ඇත්තේ රතු සහ කහපාට ඇඳුම් වලිනි. කහ පැහැයෙන් පවිත්‍රත්වයද සාමය සහ සත්‍යතාව දක්වයි. රතු පාටින් දක්වන්නේ ලෝකයේ ක්‍රියාකාරීත්වයයි. එසේම පවිත්‍රත්වය, සාමය සහ සත්‍යතාව පෙන්වයි.

මීයාගෙන් ආත්මය දක්වයි. ඌට මිනිසකු තුළ ඇති හොඳ සහ උතුම් දේ ලැට් ගැමට හැකිය. ගනේෂ දෙවියන්ගේ පා අසල මීයකු ලැග සිටී. ඉන් දක්වන්නේ යහපත් පුද්ගලයෙකු යනු ආත්මය දිනූ තැනැත්තාය යන්නය. මීයකු ලඩ්ඩු දෙස බලා සිටී. එහෙත් ඒවා නොකයි. ඉන් දැක්වෙන්නේ පවිත්‍ර වූ හෝ ආත්මය දමන කළ හෝ පුද්ගලයාට ලෝකයේ බලපෑම් වලින් හෝ පෙළඹවීම් වලින් මිදී ජීවත්වීමට හැකිය. මීයා ගනේෂ දෙවියන්ගේ වාහනයයි. ඥාණාන්විත වීමට ආත්මය පාලනය කළ යුතුය.

**ගනේෂ දෙවියන් සහ මීයා**

එක් පැහැදිලි කිරීමකට අනුව ගනේෂ දෙවියන්ගේ දිව්‍යමය වාහනය වූ මීයා හෙවත් මූෂිකම් පෙනී සිටිනුයේ ඥාණයට හැකියාවට සහ දැනීමටය. ඉන් කියැවෙන්නේ යම් ගුප්ත කරුණක් පිළිබඳව ක්ෂණික ගවේෂණයයි. මීයා පොළොව යට රහසිගත දිවියක් ගෙවයි. ඒ අනුව ඌ අවිද්‍යාවේ සහ අඳුරේ සංකේතය වන අතර ආලෝකයට සහ දැනුමට බියෙන් පසුවේ. සමහරුන්ගේ මතයට අනුව මීයා (මූෂික හෝ ආකු) සංකේත වන්නේ ආත්මයට සියළු ආශාවන් සහිත සිතට සහ පුද්ගලයාගේ අවයවයයි. ගනේෂ දෙවියන් මීයා පිට යයි. ඔහු ප්‍රධානියා වන අතර වහලෙකු නොවේ. ඔහු තුළ ඇති ඥාණ ශක්තිය සහ වෙන්කර හැඳිනිමේ ශක්තිය වුන් පෙන්වයි. මීයා බොහෝ කැදර සතෙකි. ඌ දක්වා ඇත්තේ රසකැවිලි බඳුනක් අසල සිටින විලාශයයි. ඌ බලා සිටින්නේ ගනේෂ දෙවියන් දෙස වන අතර උගේ අතෙහි බත් ගුලියක් තද කර ගෙන සිටී. එය හරියට ගනේෂ දෙවියන්ගෙන් අවසර ලැබෙන තෙක් මෙනි. මින් දැක්වෙන්නේ ඥාණ ශක්තියේ ප්‍රබලත්වයයි. අවසන් වශයෙන් ගනේෂ දෙවියන් කොතරම් නිහතමානිද විනිතද යනු වැටහේ. ගනේෂ දෙවියන්ට ඉහත සඳහන් පරිදි අති විශාල ශාරිරික, මානසික ශක්තින් තිබුණත් මීයෙකු වැනි කුඩා නොවැදගත් සතෙකු පිට යෑම එක් අතකින් පුදුමයකි.

උතුරු ඉන්දියාවේ රූප වල ගනේෂ දෙවියන් දක්වා ඇත්තේ බ්‍රහ්මයාගේ දූවරුන් දෙදෙනා වන බුද්ධි (දැනුම) සහ සිද්ධි (ආධ්‍යාත්මික බලය) සමග විවාහ වී ඇති ආකාරයටය. ගනේෂ දෙවියන් සරස්වති දේවිය (කලාවට සහ සංස්කෘතියට අධිපති දේවිය) කැටුව යයි. ඔවුහු ගනේෂ දෙවියන්ගේ දිව්‍යත්වය හඳුනාගෙන ඇත. මෙයින් දැක්වෙන්නේ ධනය, සශ්‍රිකත්වය සමග එක්වන්නේ ඥාණය, විචක්ෂණ බුද්ධිය, ඉවසීම බවයි.

අවුරුදු දහස් ගණනක් ලකුණු යෙදීමේ ක්‍රමයක ප්‍රථිඵලයක් වශයෙන් අලියෙකුගේ හිසකින් යුත් දෙවියන් බිහිවුනි. ඉන්දියාවේ පිලිමවල ඇත්තේ ලකුණු වල වටිනාකමකින් යුත් පිලිමවේ. ඒවා ජීවත්ව සිටින අපගේ නොඑසේ නම් ඔහුගේ පිලිරුවක් ලෙසය. හින්දු දෙවිවරුන් රුව මූර්ති වශයෙන් දක්වති. තායිලන්තයේ ගනේෂ දෙවියන් ඉතා වැදගත් දෙවි කෙනෙක් වශයෙන් සලකා ඇත. ඒ 7 වැනි සහ 8 වැනි ශත වර්ෂ වලදීය.

ඔහු හඳුන්වා ඇත්තේ විග්නේශ්වර්, මහා විග්නේශ්වර් සහ කුන්වනානැර යනුවෙනි.

කාම්බෝජියානුවන් පූජා සත්කාර කරනුයේ ප්‍රා කෙනේස් නමිනි. ගනේෂ දෙවියන්ගේ ආශිර්වාදය බලාපොරොත්තු වන අතර වෙළඳුන්. සංචාරකයින්, චිත්‍ර ශිල්පින් සහ පාලකයින්ද වේ. ව්‍යාපාර ලෝකයට අධිපති සහ ජාත්‍යන්තර සබඳතා වලඅධිපති ඔහු බැංකොක් වල ඇති ලෝක වෙළඳ මධ්‍යස්ථානයේ උස් ආසනයක ඔහු වාඩිවී සිටී. එයට ජනතාව මල් පහන් සුවඳ දුම් පුදයි.

කාම්බෝයේ සහ වියට්නාමයේ ගනේෂ දෙවියන් පුදනු ලැබුවේ උසස් දෙවි කෙනෙක් වශයෙනි. 7 වැනි 9 වැනි ශත වර්ෂ වලදී ඉදිකරන ලද පිලිම විශාල ප්‍රමාණයක් එහි කැනීම් වලදී හමුවී ඇත. ඒවා නෙලා ඇත්තේ ගලිනි.

සම්බාවල (දකුණු වියට්නාමයේ) ගලින් නෙලන ලද 7 වැනි සියවසට අයත් පිලිම හමුවී ඇත. මින් පැහැදිලි වන්නේ ඒ කාලය තුළ ගනේෂ දෙවියන් ජනප්‍රියව සිටි බවය.

ජපානය තුළ ගනේෂ දේව වන්දනාව 806 වර්ෂය දක්වා දිවේ. ජනාපයේ ගනේෂ දෙවියන් හැඳින්වූයේ ෂෝඩන් නමිනි. (විනයාක්ස හෙවත් ෂෝටේන්) යනුවෙනි. එහි තේරුම ගනේෂ බුද්ධ යන්නයි හෙවත් හොඳ දෙවියන් යන්නයි. ඩායි ෂෝඩන් යනු විශාල හොඳ දෙවියන් යන්නයි. එසේ ඩෙන් උන් යනු පුදනු ලබන දෙවියන්ය. පිනායකේතන් සහ කන්කිඩන් යන නම් වලින්ද ඔහු හැඳින්වේ. ජපානයේ ෆියුටාකෝ තමගාවා ටෝකියෝ වල බුදුරජාණන් වහන්සේගේ පිලිරුවට වඩා ඉහත මට්ටමක ගනේෂ පිලිමයක් ඉදිකර ඇත. ජපානය තුළ ෂිංගොන් චාරිත්‍රය පවත්නු ලැබේග ඒ ගනේෂ දෙවියන් සඳහාය.

චීන රට තුළ ගනේෂ දෙවියන්ගේ සිතුවම් සහ ගල් කැටයම් ද පොත්පත්ද ඇත. සමහර චීන ජාතිකයෝ ගනේෂ දෙවියන් කුවාන්ෂිවේන් සහ හෝතෙයි නමින් හඳුන්වති. සතුටේ බඩ ලොකු දෙවියන් ගනේෂ දේව ඇදහිල්ල චීනයේ ඇරඹී ඇත්තේ 2 වන ශත වර්ෂයේ සිටය. ගනේෂ දෙවියන් පිළිබඳව පොත්පත් වල කරුණු හැර සිතුවම් හා ගල් කැටයම්ද ඇත. සමහර චීන ජාතිකයන් විසින් ගනේෂ දෙවියන් කුවාංෂිටින් හෙවත් හෝටේ නමින් හඳුන්වනු ලැබේ. ලොකු බඩකින් යුත් සන්තුෂ්ටියේ දෙවියන්ය. චීනයේ ආගමික පොත්පත් අනුව ගනේෂ දෙවියන් දස ජරවරුන්ගෙන් කෙනෙකි. විවිධ පොත්පත් වල ගනේෂ දෙවියන් පිළිබඳ විස්තර දක්වා ඇත.

ඉන්දුනීසියානුවන් ගනේෂ දෙවියන් හඳුන්වන්නේ ප්‍රාග් කෙනෙස් (ශ්‍රී ගනේෂ්) නමින්ය. මාලි දූපත් වල ගනේෂ දෙවියන් සඳහා බොහෝ පන්සල් ඇත. පැරණි මියන්මාරයේ ගනේෂ දෙවියන් මහපිනරි පූර්හා නමින් හැඳින්වේ. එය ලැබී ඇත්තේ විනයක වලිනි. බුරුම වැසියන් මහා පියනෙ නමින් හැඳින්වේ. වෙනත් නම් කාම්බෝජියානු පොත්පත් වල සඳහන්ය. නම් විග්නේෂ සහ විග්නේෂ්වරය. (බාධක ඉවත් කරන උත්තමයා)

ඉන්දුනීසියානු කලාවට විශේෂයෙන්ම සුමාත්‍රා හා ජාවා වල ගනේෂ දෙවියන් ජනප්‍රිය විය. ඒවා 8 වන ශත වර්ෂයේ නිම කරන ලද ඉල්ලෝරා ගල්ගුහා වල ඇති රූප හා ආකාරයන් සාමානත්වයක් දක්වයි. මධ්‍යම ජාවා වල ඇති ගනේෂ දෙවියන්ගේ ප්‍රතිමා තුනක් නර්තන විලාශයකින් යුක්ත වන අතර එවා 15 වන සියවසේ සකසන ලදැයි සැලකේ. ටිබෙට් ජාතිකයින් ඔහු හඳුන්වන්නේ ටිස් ඕග්ස් ඩැග් යනුවෙනි. එහි ගනේෂ වන්දනාව ඇරඹී ඇත්තේ 11 වන ශත වර්ෂයේය. ටිබෙට් බෞද්ධයින් ගනේෂ දෙවියන් සලකන්නේ බෞද්ධ දෙවියෙකු ලෙසය. එසේ තවමත් සිටින දෙවියෙකු ලෙසිනි. ටිබෙට් ගනේෂ දෙවියන් කලා නිර්මාණ වල දිස්වන්නේ බුදුරජාණන් අසල සිටින ආකාරයටය. ග්‍රීකවරුන් ඔහු හඳුන්වන්නේ ජානුස් නාමයෙන් වන අතර සෑම කටයුත්තක් ආරම්භයේදීම මෙම දෙවියන්ගේ ආශිර්වාදය ලබාගනී.

ග්‍රීසි ශිෂ්ටාචාරයට අනුව දෙවියන්ගේ 9 වන ජනුස් නමින් ජනවාරි මාසය නම්කර ඇත. එයට අලියෙකුගේ හිසක් ඇත. සමහරවිට ඔහු හිස් දෙකකින් යුත් දෙවියෙකු ලෙස දක්වයි. ගනේෂ දෙවියන්ට මෙන්ම ජානුස් දෙවියන්ටද යම් කටයුත්තක් ඇරඹීමට පෙර පුද සත්කාර කරනු ලැබේ.

පොලිනීසියානුවන් ගනේෂ දෙවියන් වඳින්නේ ලෝකේ දෙවියන් වශයෙනි. මොන්ගෝලියන්වරු විනායක දෙවියන් හඳුන්වන්නේ ටෝබාර් අවර් බාගම් ගනේෂ යනුවෙනි. මෙම වන්දනාව මොන්ගෝලියාවට හඳුන්වා දී ඇත්තේ ටිබෙට් රටෙනි. එම වන්දනාව ප්‍රචලිත වී ඇත්තේ 12 වන සහ 17 වන ශත වර්ෂ වල සිටය.

ඇෆ්ගනිස්ථානයේ කාටෝස් නුවරින් ගනේෂ දෙවියන් කිරිගරුඬ ප්‍රතිමාවක් හමුවී ඇත. මෙම පිළිමය තනා ඇත්තේ ක්‍රි.පූ. 500 දීය. සමහර අය ගනේෂ දෙවියන් සොබාදම් මව ලෙස සලකති.

ගනේෂ දෙවියන්ගේ පැරණිම පිලිමය ඇත්තේ ශ්‍රී ලංකාවේ මිහින්තලේ කන්ටක චෛත්‍ය අසලය. එය ක්‍රි.පූ. පළමු සියවසේ දී නම්කර ඇත. ජයිනා ආගමේ ගනේෂ දෙවියන්ට උසස් ස්ථානයක් ලැබී ඇත්තේ කලාතුරකිනි.

නේපාලයේ කත්මන්ඩු නිම්නයේ ප්‍රධාන පෙලේ රූප තුනක් ඇත. ඒවා නම් අශෝක්, සූර්‍යා, චන්ද්‍ර සහ හිඟදාය. එම නිම්නයේ ගණපති දෙවියන් බුද්ධ විහාර රැක බලා ගනී. ඔහු වර්ණනා කෙරෙන භජන් ගී ගයති. බොහෝ පන්සල් වල ගනේෂ දෙවියන්ට වෙනම දේවාල ඇත.

ඉන්දුනීසියානු මුස්ලිම්වරුද ගණදෙවියන්ට පුද පූජා කරති. යුරෝපා රටවල අය කියන්නේ ඒ ඥාණයට අධිපති ඉන්දුනීසියානු දෙවියා කියාය.

බැංඩුං වල වැසියෝ ජාලන් ගනේෂ පිළිබඳ වර්ණනා කරති. ඔහුගේ රූපය රුපියල් 20000 කොළය සරසයි.

චන්ද්‍රයාගේ ගෙවී යන දහ හතරවන දිනයේ ශිව දෙවියන්ගේ මහා රාත්‍රිය උත්සවාකාරයෙන් පවත්වනු ලැබේ. සියළු බලධාරි දෙවියන් වෙනුවෙන් කැපවී පවතින උත්සවයන් සහ භක්තිමත් දිනයන් අතරින් පෙබරවාරි - මාර්තු වල යෙදෙන මඝ මාසයේ කළුවර පසු බාගයේ දහ හතර වැනි රාත්‍රිය ඉතාම ශුභය.

වත්මන් ජිවිත පිළිවෙලවල් අනුව අප බොහෝ දෙනෙකුට සෑම ආගමික උත්සවයක් සහ මංගල්‍යයක් පැවැත්වීම අසීරුය.

සර් මොනියර් විලියම්ස් ඔහුගේ "බ්‍රාහ්මන ආගම සහ හින්දු ආගම" හි සඳහන් කරන පරිදි මධ්‍යස්ථ බලවේගයක් යටතේ රඳන ආගමික සංවිධානයන් වලින් සුදුසුකම් ලබන්නාවූ උත්සව හා ප්‍රීතිවීමේ කාලයන් හා කැපවීමේ කාලපරිච්ඡේදයන්ගෙන් ගහන වෙනත් ආගමක් නැත්තේය.

ලොව පුරාම සිටින ශිව බැතිමතුන් විසින් මහා ශිව රාත්‍රිය උත්සවාකාරයෙන් පවත්වනු ලැබේ. ආගමික සහ දර්ශන විද්‍යාවට අමතරව වුවද, ශිව දෙවියන්ගේ මහා රාත්‍රිය පැවැත්වීමෙන් ලෞකික කාර්යන්හි නිරතව සිටින බොහෝමයක් අපට ආධ්‍යාත්මික ජිවිතය ගැන මතක් කර ගැනීමේ අවස්ථාව උදාවන්නේය.

ශිව දෙවියන්ගේ මහා රාත්‍රිය පැවැත්වීමේ ආරම්භය ඈත පුරාණයන් සමග වැසී යන්නේය. නමුත් මහා ශිව රාත්‍රිය පැවැත්වීමේ ඵලය සහ ආරම්භය විස්තර කිරීමට නොයෙකුත් කථා ඇත්තේය.

මහා භාරත කාව්‍යයේ එන ශාන්ති පාර්ව, ලිංග පුරාන, ශිව දෙවියන්ගේ මහා රාත්‍රිය නින්දෙන් තොරව යන උපවාසයෙන් ගත කිරීමෙන් තම ආත්මයටත්, මානසිකවත්, නුවණ පිළිබඳවත් ප්‍රයෝජන බැතිමතුන්ට ලැබෙන්නේය.


මූලික වශයෙන් ශිව ලිංගයට වැඳුම් පිදුම් කිරීමෙන් මහා ශිව රාත්‍රිය මුළුල්ලේම ශිව දෙවියන්ට උපහාර දක්වති. දහවල් කාලය තුළ උපවාස කිරීමෙන් සහ රාත්‍රිය පුරා සියළු බලධාරි දෙවියන් වෙත වැඳුම් පිදුම් කිරීමෙන්ද මහා ශිව රාත්‍රිය පවත්වති.


ශිව දෙවියන්ගේ මහා රාත්‍රිය "යාම හතර" වශයෙන් කොටස් හතරකට බෙදේ. මෙම සෑම කොටසක් පිළිගත් සිරිත් අනුව ශිව දෙවියන් වෙනුවෙන් පුරානයන් සහ ආගමික පොත්පත් වල සඳහන් වන ආගමික පිළිවෙත් ක්‍රම අනුව "ශිව ලිංගයට" වඳිති, උපහාර දක්වති. ඒ ඒ පොත්පත් අනුව ආගම ඇහිමේ ක්‍රම වෙනස්වේ.

ශිව දෙවියන්ගේ මහා රාත්‍රිය පැවැත්වීමට අදාල වන තද බල නිතිරීති නොමැත්තේය. එනමුත් සාමාන්‍ය පැවැත්මකට වඩා භක්තියෙන් අවංක භක්තිය වඩාත් අවශ්‍යය. තිරුවාචකම් සහ පෙරිය පුරානම් හි පනප්පා නයනාර් කථාවෙහි මෙය වඩාත් විස්තර වේ.

ඉතා ඈත අතිතයේ සිට තායිලන්තයේ පෙබරවාරි-මාර්තු වල යෙදෙන මඝ මාසයේ පසලොස්වක දිනයේ ශිව රාත්‍රි උත්සව පවත්වනු ලැබේ. ආගම් සහ ගුණ ධර්ම අකරාදියෙහි මේ පිළිබඳ දීර්ඝ විස්තරයක් ද ඇත.

ශිව භක්තිකයන් විසින් මහා ශිව රාත්‍රි දිනය පවත්වන දිනයේම ජෛන ආගමිකයන් විසින්ද ශිව රාත්‍රි උත්සවාකාරයෙන් පවත්වන්නෝය.





# කාළි දේවි

## කාළි ධ්‍යානම්

ශ්‍යාමාංගිං රක්ත වස්ත්‍රාං ජ්වල දරුණ සිතිං
අෂ්ට හස්තාන්ජ ත්‍රිනේත්‍රාං ශූලං වේතාළ ඛඩ්ගං
ඩමරුක සහිතං වාම හස්තේ කපාලං අන්‍යාන් සන්ධෙෂු
ඛේටම් හල මුසල යුක්තාං රෞද්‍රාභාංසාං උදංදෂ්ට්‍රාං
චාමුණ්ඩ රූපමේතං භුවන වශංකරී භද්‍රකාළී නමස්තේ

කාළි දේවි යන්නෙහි තේරුම කාළය [වේලාව] යන තේරුම ද කළු පැහැයෙන් යුක්ත නිසාද කාළි නාම භාවිත කෙරේ.

දේව මාතා ලොවෙහි පාලනය සිදුකරන ප්‍රධාන ශක්ති දහය දස විද්‍යා නමින් හැඳින් වේ.එම දස විද්‍යාවට අයත් වන්නේ කාළි දේවි,ශෝඩශී දේවි,භුවනෙශ්වරී දේවි,භෛරව දේවි,ජින්නමස්තා දේවි,ධූමවතීදේවි ,මාතන්ගි දේවි, කමලා දේවි,බග්ල මුකී දේවි යයි.මෙම දස ශක්ති වලින් ප්‍රධාන හා බලවත් ශක්ති බලය කාළි දේවි ශක්තියයි.

ලොවෙහි උපදින සියලු ශාක හා සත්ව යන්ගේ උප්පත්තිය හා මරණය යන අවස්ථා ද එම අවස්ථා අතර සිදුවන සියලු සිදුවීම් ද පාලනය කරන්නේ කාළි දේවි ශක්තිය මගිනි.තන්ත්‍ර යෝග ශාස්ත්‍ර වල කාළි දේවි ශක්තියට ප්‍රමුඛ ස්ථානයක් හිමිව ඇත.නිර්වාණ තන්ත්‍ර ශාස්ත්‍රයේදී කාළි දේවි ශක්තිය මගින් බ්‍රහ්ම,විෂ්ණු,මහේශ්වර ශක්ති ආරම්භ වීමට මූලික වී ඇත.නිරුතාර තන්ත්‍ර ශාස්ත්‍ර,පිච්ඡිල තන්ත්‍ර සාස්ත්‍ර වල දී කාළි දේවි ශක්තිය සඳහා ගායනා කරන මන්ත්‍ර ඉතා බලවත් මෙන්ම ශ්‍රේෂ්ඨ ද වන බව සඳහන් වේ.යෝගිනී තන්ත්‍ර ශාස්ත්‍ර,කාමාඛ්‍ය තන්ත්‍ර ශාස්ත්‍ර,ණිරුතාර තන්ත්‍ර ශාස්ත්‍ර, වල කාළි දේවි ශක්තිය ප්‍රමුඛ මෙනම ශ්‍රේෂ්ඨ බව දක්වා ඇත.මහා නිර්වාන තන්ත්‍ර ශාස්ත්‍රයේ

කාළි දේවි ශක්තිය ලොවෙහි ආරම්භක ශක්තිය ලෙස සඳහන් වේ.කාළි දේවියගේ ප්‍රධාන ස්වරූප [අවතාර] 14 කි. දූර්ගා දේවි,භවානි දේවි,සතිදේවි, රුද්‍රාණිදේවි, පාර්වතිදේවි,රාජරාජෙස්වරි දේවි, ඡාමුන්ඩා දේවි,කාමාක්ෂිදේවි, මීනාක්ෂිදේවි, කාමාඛ්‍යදේවි, උමාදේවි, භෛරවිදේවි, කුමාරිදේවි, තාරාදේවි ලෙස සඳහන්වේ.
භක්තිමතුන්ගේ මමත්වය [උඩගුකම] නැති කරන්නේ කාළි දේවි ශක්තියයි.බැතිමතුන්ගේ ධෛර්ය සිද්ධිය ඇති කරන්නේද කාළි දේවි ශක්තියයි. බැතිමතුන්ගේ ආරක්ෂාව, සතුරු මර්ධනය, ධන ලාභ, ශාස්ත්‍ර විද්‍යා සඳහා මූලික වන්නේද කාළි දේවි ශක්තියයි.

හින්දු ධර්මය ලියවී ඇත්තේ මූලාධාර වේදයේය.වේදයේ ප්‍රමුඛත්වය පංච භූත සංකල්පය වේ පංච භූත නම්,ආපෝ -ජලය- තේජෝ-ගින්න නොහොත් අග්නි- පඨවි-,පොළව-වායු-සුළඟ-, ආකාස-.රික්තය. [ හිස්කම ] වේදයේ ප්‍රධාන කොටස් සතරකි.එනම් රුග් වේද, යජුර්වේද ,සාමවේද ,අදර්වණ වේද සතර කොටස් ලෙස හැඳින් වේ.
රුග් වේදයේ මූලික පූජා ක්‍රමය ලෙස අග්නි පූජාව සඳහන් වේ.අග්නි පූජාව යනු පොලවේ සාදන වලක් තුලට ඒ සඳහා විශේෂ දැව වර්ග භවිතයෙන් ගිනි දල්වා එම ගින්දරට විවිධ පූජා ද්‍රව්‍ය දමමින් සිදු කරන පූජාව අග්නි [හෝම] පූජාව නමින් හැඳින් වේ.මෙම පූජා ද්‍රව්‍ය ගින්දරින් පිලිස්සීමෙන් පිට වන දූම ආඝ්‍රාණය කරමින් දෙවියන් සතුටු වන නිසාමෙම පූජා ක්‍රමය සිදු කෙරේ.
මෙම ගිණි දැල්ල ප්‍රධාන වශයෙන් වර්ණ සතක් අඩංගු වේ.ඒනම් කළු වර්ණය,දම් වර්ණය,කොළ වර්ණය,කහ වර්ණය,තැඹිලි වර්ණය,රතු වර්ණය, නිල් වර්ණය, යන වර්ණ සත ලෙස සඳහන්වේ.මෙයින් කළු වර්ණය සහිත ගිනි දැල්ල මගින් සංකේත වන්නේ. කාළි දේවි ශක්තියයි මේ පිළිබඳ වැඩි විස්තර සඳහන් වන්නේ දේවි මහාත්මිය ස්තෝත්‍රයේදීය.මර්ඛන්ඩෙය පුරාණයේදී කාළි දේවි ශක්තිය හැඳින්වන්නේ ඡන්ඩි ධූර්ග සප්ත සති යන නමින්ය.
මෙහි තේරුම දේව ශක්ති හා අසුර ශක්ති අතර ගැටීම් [යුද්ධ] සිදු වන විට දේව ශක්ති ආරක්ෂා කර ජයග්‍රහණය කරවීමට මූලික වන්නේ රුග් වේදයේ සඳහන් වන ආකාරයට කාළි දේවි ශක්තියයි.මේ සිද්ධිය කර්පූරාදි ස්තෝත්‍ර වලින්ද පැහැදිලි වේ.

කාළි දේවියට ප්‍රධාන ලෙස අත් සතරකි.ඉන් වම් පස අත් දෙකක්ද දකුණු පස අත්දෙකක් ද වේ.වම් හා දකුණු පස ඉදිරි අත් දෙකින් අභය මුද්‍රාව දැක් වේ. මෙයින් භක්තිමතුන් ඉපදීමේ සිට මරණය දක්වා කාළි දේවි ශක්තිය මගින් ආරක්ෂා කරන බව ද මූර්තිමත්වේ.

වම් පැත්තේ පසු පස අතින් අසුරයෙකුගේ සිඳින ලද හිසක් කෙස් වලින් අල්ලා ගෙන සිටී.මේ මගින් මරණය නියම බව මූර්තිමත් කෙරේ. දකුනු පැත්තේ පසු පස අතින් කඩුවක් ගෙන සිටී.මේ මගින් මරණ අවස්ථාව තීරණය කරනු බව මූර්තිමත් කෙරේ.කාළි දේවි ය සිංහයකු වාහනය කරගෙන සංචාරය කරන බව දැක්වේ.මෙම සිංහ මූර්තියෙන් දැක්වෙන්නේ නිර්භීත හා දැඩි ක්‍රියාකාරිත්වයෙන් යුක්ත ශක්තියක් කාළි දේවියට ඇති බවයය.

## ශිව දෙවියන්ගේ මහා රාත්‍රියේ වැදගත්කම

### ආගමික වැදගත්කම

දෙවියන් වහන්සේගේ ඉතාම උසස් වරය අප වෙත ලබාගැනීමට අප බලාපොරොත්තු වන්නේ නම්. එම වරය ලැබීමට තරම් අප සුදුස්සන් විය යුතු බව එතුමන් ස්වභාවයෙන්ම බලාපොරොත්තු වනු ඇත. අප ඉතාම ඇලුම් කරන දේ කැප කිරීමට අප සූදානම් ව සිටිය යුතු යැයි එතුමන් බලාපොරොත්තු වේ. ජීවිතයට අත්‍යවශ්‍ය, මිනිසා ඉතාම ඇලුම් කරන දේ නින්දය. අධිෂ්ඨානයෙන් යුත් සිතකින් යුක්තව අපගේ එම ආරණීය දේ (එනම් අප ඕතරම් ආශාවෙන් ඇලුම් කරන දෙය නින්ද) ශිව රාත්‍රි දිනයේ කැප කිරීමට අප සූදානම් නම්, අන්න එවිට දෙවියන්ගෙන් තෑගි ලැබීමට අප සුදුස්සන් වෙමු. මූලික අදහස වනුයේ, අප වඩාත් ඇලුම් කර දෙය කැප කිරීමට අපට සූදානම් කිරීමය. හොඳ දේ ලබන්නවුන් යැයි ඔප්පු කිරීම සඳහා, පුරා-රැයත්-පසු දිනයෙත් අප අවදිව සිටිමු. ඒ මන්ද යත් අපට නොදැනුවත්වම පසු දිනයේ නින්ද යන නිසාය. රැයක් සහ දහවලක් තුළදී නින්ද කැප කිරීමට අපට හැකිනම් එවිට අප පරීක්ෂණයෙන් සමත්වූවෝ වෙමු. ශිව දෙවියන්ගේ මහා රාත්‍රිය වන ශිව රාත්‍රියේ ආගමික වැදගත්කම මෙයයි.

### මනස පිළිබඳ වැදගත්කම

ශරීරයට විෂ ඇතුළු වූ කෙනෙක් නොනිදා ගත යුත්තේ විෂ සහිත සිරුරක් ඇති අයෙකු හට නින්ද ගිය හොත් ඔහු ජීවිත හානියට පත්වෙතැයි වෛද්‍ය මතය නිසාය. කිරි මුහුදෙන් නඟින ලද විෂෙන්, මෙම මුළු මහත් ලෝකය බේරා ගැනීමේ චේතනාවෙන් ශිව දෙවියන් එම විෂ ගත්තේය. අප වෙනුවෙන් අප දෙවියන් රැයක් නොනින්දේ නම්, එතුමන්ට අප ගෙවිය යුතු ණය වෙනුවෙන්වත් රැයක් අවදිව සිටිය යුතුය.

අපට නිදි නැති කල්හි ශාරීරික වශයෙන් තනිව (හිස්ව) සිටීම අප්‍රයෝජනය සම්පූර්ණ රැය තුළම සිතින් අප දෙවියන් ගැන සිතමින් සිටිය යුතුය. නමුත් සාමාන්‍ය පොදු ජනතාවට නොනිදා සිටින අතරම සිතින් දෙවියන් ගැන හිතිමට පුලුවන් කමෙන් නැත. කොයි ආකාරයෙන් හෝ මොන හේතුවක් නිසාවත් සම්පූර්ණ රැය පුරාම නොනිදා සිටිය හැකි වුවහොත් එවිට ප්‍රතිඵල ලැබේ. මෙම කාරණය ඔප්පු කිරීම් වස්, ශිව දෙවියන් සඳහා කැපවූ රාත්‍රියෙක් තුළදී කොටියෙකුට බියෙන් නොනිදා සිටි දඩයම්කරුවෙකුගේ කථාව කියවේ. මෙම දඩයම්කරුගේ චේතනාව වූයේ දෙවියන් වෙනුවෙන් ඔහුගේ නින්ද කැප කිරීම නොවේ. ඔහුට අවශ්‍ය වූයේ කොටියාට බිලි නොවී ඔහුගේ ජීවිතය බේරා ගැනීමය. එනමුත් නියමව තිබූ දිනයක දෙවියන් වෙනුවෙන් අවදිව නොසිටියත් අඩු වශයෙන් නිදි නොමැති රැයක් ගත කිරීමෙන් ඔහු සම්පූර්ණ ඵලය ලද්දේය. කෙසේ හෝ නොනිදා රාත්‍රිය ගත කිරීමට මෙම කථා දිරි ගන්වයි. මෙය සාමාන්‍ය ජනතාව උනන්දු කරවීමටය.

# ශ්‍රී ගණේෂ පංචරත්න ස්තෝත්‍ර

ශ්‍රී ගණ දෙවියන්ගේ ශක්තිය පිළිබඳ සාරාංශයක් ලෙස සකස් කරන ලද ස්තෝත්‍ර සය ගණේෂ පංචරත්න ස්තෝත්‍ර ලෙසින් හැඳින් වෙයි“

1. මුදා කරාර්ත මෝදකම් සදා විමුක්ති සාදකම්
කරාදරා වදම්සකම් විලාසිලෝක රක්‍ෂකම්
අනාය කෙක නායකම් විනාශිතේභ දෛත්‍යකම්
නතාශු භාෂු නාසකම් නමාමි තම් විනායකම්

2. නතේතරාති භිකරම් නවෝදි තාර්ක භාෂ්වරම්
නමත්සුරාරි නිර්ජරම් නතාදිකාප දූර්ධරම්
සුරේශ්වරම් නිදිශ්වරම් ගජේශ්වරම් ගණේශ්වරම්
මහේෂ්වරම් තමාශ්‍රයේ පරාත්පරම් නිරන්තරම්

3. සමස්තලෝක සංකරම් නිරස්ත දෛත්‍ය කුංජරම්
ධරේත රෝධරම් වරම් වරේභ භක්ත්‍ර මක්ෂරම්
කෘෂාකරම් ශමාකරම් මුදාකරම් යශෂ්කරම්
මනස්කරම් නමස්කෘතාම් නමස්කරෝමි භාස්වරම්

4. අකිංච නාර්ති මාර්ජනම් සිරන්ත නෝක්ති භාජනම්
පුරාරි පූර්ව නන්දනම් සුරාරි ගර්ව සර්වනම්
ප්‍රපංච නාශ භීෂනම් ධනංජයාදි භූෂනම්
කපෝලධාන වාරනම් භජේ පුරාන වාරනම්

5. නිතාන්ත කාන්ත ධන්ත කාන්ති මන්දකාන්ත කාත්මජම්
අචින්ත්‍යරූප මන්තහීන මන්තරාය කෘන්තනම්
හෘදන්තරේ නිරන්තරම් වසන්ත මේව යෝගිනාම්
තමේක ධන්ත මේවතම් විචින්තයාම් සන්තතම්

6. මහා ගනේෂ පංචරත්න මාධරේන යෝන්වහම්
ප්‍රජර්පති ප්‍රභාතකේ ර්දිස්මරන් ගණේෂ්වරම්
අරෝගතා මධෝෂතාම් සුසාහිතිම් සුපුත්‍රතාම්
සමාහිතා යුරෂ්ඨ භූති මබ්‍යුපෛති ස්ත්‍රෝතාත්

## ශ්‍රී ගනේෂ භුජංග ස්ත්‍රෝත්‍ර

ශ්‍රී ගණ දෙවිදුන්ගේ සියළු පූජා කටයුතු අවසානයේදී එම පූජාවන් කාරුණිකව පිළිගන්නා ලෙස ඉල්ලමින් ගායනා කරන ස්ත්‍රෝත්‍ර ශ්‍රී ගනේෂ භුජංග ස්ත්‍රෝත්‍ර නමින් හැඳින් වේ“

1. රනත් ශුද්‍ර ඝන්ධා විනාධා භුම්භම්
චලත් තාන්ඩ වෝද්ධාන්ඩ වත් පද්ම තාලම්
ලසත් තුන්ධිලාන් ගෝපරී ව්‍යාල භාරම්
ගනාධීශ මීශාන සූනුම් තමීඩේ

2. ද්වනිත් වම්ස විනාල යෝර්ලාසි වක්ත්‍රම්
ස්පුරශ්චුන්ඩ ධන්ඩෝල් ලසත් භීජපූරම්
ඝලධර්ප සෞගන්ධ්‍ය ලෝලාලි මාලම්
ගනාධීශ මීශාන සූනුම් තමීඩේ

3. පුකාසජ් ජපාරත්න රත්න ප්‍රසූත
ප්‍රවාල ප්‍රභාතාරුන ජ්‍යෝති රේකම්
ප්‍රලම්භෝධරම් වක්‍ර තුන්ඩෛක දන්තම්
ගනාධීශ මීශාන සූනුම් තමීඩේ

4. විචිත්‍ර ස්පුරත් රත්න මාලා ක්‍රිටම්
ක්‍රිටෝල් ලසච් චන්ද්‍ර රේඛා විභූෂම්
විභූශෛක භූෂම් භවත් වම්ස හේතුම්
ගනාධීශ මීශාන සූනුම් තමීඩේ

5. උඩන්ඩද් භුජා වල්ලරී ධඃෂ්ය මූලෝප්ජලධි
බඃඃලතා විජ්භ්‍රම පූජදක්ශම්
මරුත් සුන්දරී චාරරෙයි සේව්‍යමානම්
ගනාධිශ මීශාන සූනුම් තම්ඩේ

6. ස්පුරත් නිශ්ටුරා ලෝල පින්ගාකෂි තාරම්
කඃපා කෝමලෝ ධාරා ලීලා චතාරම්
කලා හින්දුගම් ගිතයේ යෝගි වර්යෙයි
ගනාධිශ මීශාන සූනුම් තම්ඩේ

7. යමේකාක්ෂරම් නිර්මලම් නිර්විකල්පම්
ගුනාතිත මානන්ද මාකාර සූන්‍යම්
පාරඩිම්කාර මාම්නාය ගර්හම්
ගනාධිශ මීශාන සූනුම් තම්ඩේ

8. විදානන්ද සන්ද්‍රාරාය ශන්දායා තුභ්යම්
නමෝ විශ්ව කර්ත්‍රේව හර්ත්‍රේව තුභ්යම්
නමෝ නන්ද ලීලාය කෛවල්‍ය භාසේ
නමෝ විශ්ව බීජ ප්‍රසිදේශ සූනෝ

9. ඉමම් සුස්තවම් ප්‍රතරුත්තාය භත්ත්‍යා
පඨේධ්‍යස්තු මර්යයු ලභේත් සර්වකාමාන්
ගණේශ ප්‍රසාදේන සිද්ධ්‍යන්ති වාචෝ
ගණේශ විභයසූ දුර්ලභම් කිම්ප්‍රසන්නේ

## ශ්‍රී ගණේෂ ශෝඩස නාමාවලිය

ශ්‍රී ගණ දෙවියන්ගේ ප්‍රධාන මෙන්ම බලවත් අවතාර දහසය සිහිපත් කර නමස්කාර කිරීම ශ්‍රී ගණේෂ ශෝඩස නාමාවලියෙන් සිදුකෙරේ

1. ඕම් සුමුඛාය නමහා
2. ඕම් ඒකදන්තාය නමහා
3. ඕම් කපිලාය නමහා
4. ඕම් ගජකර්ණකාය නමහා
5. ඕම් ලම්බෝදරාය නමහා
6. ඕම් විකටාය නමහා
7. ඕම් විඝ්නරාජාය නමහා
8. ඕම් විනායකාය නමහා
9. ඕම් ධූමකේතවේ නමහා
10. ඕම් ගණාධ්‍යක්ෂාය නමහා
11. ඕම් බාලචන්ද්‍රාය නමහා
12. ඕම් ගජානනාය නමහා
13. ඕම් වක්‍රතුන්ඩාය නමහා
14. ඕම් සූර්පකර්ණාය නමහා
15. ඕම් හේරම්භාය නමහා
16. ඕම් ස්කන්ධපූර්වජාය නමහා

